# අතීතයේ භික්ෂූන්ගේ වාසස්ථානයක් වූ බඹරගල රජමහා විහාරය

එස්. නිසංසලා කුමාරි[16]

---

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැවේගම පුදේශයේ බඹරගල රජමහ විහාරය පිහිටා තිබේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ අතීත මානවයා වාසය කරන ලද බවට උපකල්පනය කරනු ලබන සාධක සහිත ව මධ්‍යම කඳුකරයෙන් හමුවන ඉතා වැදගත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයක් වශයෙන් හැඳින්වීම ට පිළිවන. පූර්ව බ්‍රාහ්මීය ලෙන් ලිපි කටාර සහිත ලෙන් සංකීර්ණයක් සහ ඉතා පැරණි සංඝාවාසයක් සහිත විහාරයක් ලෙස ද බඹරගල රජමහා විහාරය හඳුන්වාදිය හැකි ය. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ක්‍රමිකව විකාශනයක් මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව හඳුනා ගත හැකි ය. රාජ්‍ය අනුග්‍රහය නොමද ව අතිතයේ ලැබී තිබෙන අතර කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ අනුග්‍රහය ලැබීමෙන් අනතුරුව රජමහා විහාරයක් වූ බව පැවසිය හැකි ය. රජමහා විහාරයක් බවට පත්වීමෙන් අනතුරු ව සියලු විහාර අංග වලින් සමන්විත ස්ථානයක් වූ මෙහි ප්‍රධාන ප්‍රතිමා ගෘහය සහ අනෙක් ස්ථාන වලින් හමුවන සිතුවම් මහනුවර යුගයට අයත් බව පැවසිය හැකි ය. මෙහි දී අතීතයේ පටන් භික්ෂු වාසස්ථානයක් ව පැවති බව ට දැනට ශේෂ ව ඇති සාක්ෂි අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ . ක්‍රිස්තු පූර්ව යුගයේ සිට මෙම පර්වත පියැසි ආශ්‍රිත කටාර කෙටූ ලෙන් තුළ භික්ෂූන් වාසය කළ බව එහි ඇති පූර්ව බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන් ලිපි වලින් පැහැදිලි වේ. පර්වත පියසි වලින් සමන්විත මෙම විහාරාරාම සංකීර්ණය නිහඬ නිසංසල පරිසරයක පිහිටා තිබෙන බැවින් භාවනායෝගී භික්ෂූන්ට වාසය කිරීමට උචිත යැයි පැවසීමට පිළිවන. කටාර සහිත ලෙන් ආශ්‍රිත ව හමුවන ලෙන් ලිපි දෙස අවධානය යොමුකිරීමේ දි අපට පැහැදිලි වනුයේ භික්ෂු පරිහරණය උදෙසා ප්‍රභූවරුන් සහ රාජකීය පුද්ගලයන්ගෙන් ලෙන් පූජා කර තිබෙන බව ය. පිවිසුම් දොරටුවේ සිට මීටර් 60 ක් පමණ ඉහළ පර්වතය දෙසට ගිය විට දකුණු දෙසින් දැක්වෙන පර්වත පියස්සේ කටාරයට යටින් පොචනි රජ ලෙස සඳහන් කර තිබෙනු දක්නට ලැබේ. එ මඟින් උපකල්පනය කළ හැක්කේ ප්‍රධාන රජතුමාට අනුබද්ධ ව ප්‍රාදේශිය පාලකයෙක් විසින් මෙම ප්‍රදේශය පාළනය කර තිබෙන බව ය. දකුණු දෙසින් දක්නට ලැබෙන ලෙන ප්‍රධාන කොටස් දෙකක් ලෙස බෙදා අලංකාර ලෙස සිතුවම් කර තිබෙන අතර එම ලෙන පිටතින් සක්මන් මලුවක් ඉදිකර තිබේ. භික්ෂූන් වහන්සේලාට භාවනා කිරීමට උචිත වන ආකාරයට මෙම පර්වත පියසි වල කටාර කොටා සිතුවම් නිමවා සකසා තිබෙන බවට දැනට ශේෂ ව තිබෙන පුරාවිද්‍යාත්මක සාධක මඟින් පැහැදිලි වේ.

ප්‍රමුඛ පදඃ බඹරගල රජමහා විහාරය, කටාරම් සහිත ලෙන්, සෙල් ලිපි, භික්ෂු වාසස්ථානය, සිතුවම්

---

[16] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, nisansla.pera.92@gmail.com